සවියෙන් පෙරට අපි එකට

e- ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 8 | පුරවැසි අධ්‍යාපනය | 2 | 03. බහු සංස්කෘතික ජන සමාජය |



සැකසුම: කේ.ඒ.එන් ප්‍රියදර්ශනී මිය

බප/හො/මේධංකර ම.වි


## සංස්කෘතිය යනු ,

- මිනිසා විසින් අයත් කරගෙන ඇත්තා වූ දැනුම , විශ්වාස , කලා සිරිත් විරිත් , ජීවනෝපාය ආදී වූ සියල්ලයි.

## සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ සමාජ හා මානව විද්‍යාඥයින්,




ඊ බී ටයිලර් මහතා



මහාචාර්ය විමල් දිසානායක මහතා

බහු සංස්කෘතික සමාජයක් යනු,

- එකම රටක් තුල විවිධ ජන වර්ග ජීවත් වීම
- විවිධ ආගම් අදහන
- විවිධ සිරිත් විරිත් අනුගමනය කරන
- විවිධ භාෂා කතා කරන
- මිනිසුන්ගෙන් සමන්විත ජන සමාජයකි .

- බහු සංස්කෘතික සමාජයක ජීවත්වන සෑම පුරවැසියෙකුම අන්‍යෝන්‍ය විශ්වාසයකින් හා සාමූහිකත්වයෙන් කටයුතු කළ යුතුය.

**බහු සංස්කෘතික සමාජයක වැසියන් සියළු දෙනා එකට එක්ව කටයුතු කිරීමෙන් සැලසෙන වාසි ,**

- ගැටුම් අවම වීම .
- සාමූහිකත්වය වර්ධනය වීම .
- තිරසාර සංවර්ධනය උදාවීම .
- රට සංවර්ධනය වීම .

**බහු සංස්කෘතික සමාජය පවතින රටවල්**

❖ ශ්‍රී ලංකාව

❖ ඉන්දියාව

❖ ඇමරිකා එක්සත් ජනපදය

❖ බ්‍රිතාන්‍යය


**බහු සංස්කෘතික සමාජයක ලක්ෂණ,**

- ❖විවිධ ජන වර්ග ජීවත් වීම.
- ❖විවිධ ආගම් අදහන ජන කොටස් ජිවත් වීම .
- ❖විවිධ භාෂා කතා කරන ජන කොටස් ජිවත් වීම .
- ❖විවිධ සිරිත් විරිත් දක්නට ලැබිම .
- ❖විවිධ සංස්කෘතික උරුම පැවතීම .

- බහු සංස්කෘතික ජන සමාජයක විවිධ ජන වර්ග ජීවත් වන නිසා විවිධත්වයක් දැක ගත හැකිය .







## බහු සංස්කෘතික සමාජයක ජීවත්වන පුරවැසියන් ප්‍රගුණ කරගත යුතු ගුණාංග රැසක් වේ .

### එනම් ඃ

- සැම ජනවර්ගයටම අයත් පුද්ගලයන්ට ගරු කිරීම .
- සැම ජනවර්ගයටම අයත් පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම .
- අන්‍ය ආගම් වලට අවමන් නොකිරීම .
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම හා සියලු සංස්කෘතික උරුම ආරක්ෂා කිරීම .
- අන්‍ය මත ඉවසීම හා ඉවසීම හා ඒවාට ගරු කිරීම .
- තම යුතුකම් නොපිරිහෙලා ඉටුකිරීම .

- ශ්‍රී ලංකාවේ සංස්කෘතීන් ආගම මුල් කරගෙන ගොඩ නැගී ඇත.
- සෑම ආගමක් හා සම්බන්ධ වූ සිරිත් විරිත් ආගමික උත්සව පවතී.









| ආගම | සංස්කෘතිය | ආගමික උත්සව | පැවැත්වීමේ අරමුණ |
|---|---|---|---|
| බෞද්ධ | බෞද්ධ සංස්කෘතිය | වෙසක් | බුදුරජානන් වහන්සේගේ උප්පත්තිය බුදුවීම සහ පිරිනිවීම යන අවස්ථා තුන සිහි කිරීම |
| | | පොසොන් | ලංකාව බුදුදහම රැගෙන මිහිදු මහරහතන් වහන්සේ ඇතුළු පිරිසගේ පැවතීම |
| | | ඇසළ | සිදුහත් බෝසතාණක් බුදුධත්වයට පැමිණ පළමු ධර්ම දේශනාව පැවැත්වීම |



| ආගම | සංස්කෘතිය | ආගමික උත්සව | පැවැත්වීමේ අරමුණ |
|---|---|---|---|
| හින්දු | හින්දු සංස්කෘතිය | තෛපොන්ගල් | ගොවිතැනට උදවු දුන් සූර්ය දෙවියා වන්දනා කිරීම ගවයාට කෘත ගුණ සැලකීම |
| | | දීපවාලී | |
| | | මහා ශිව රාත්‍රිය | |



| ආගම | සංස්කෘතිය | ආගමික උත්සව | පැවැත්වීමේ අරමුණ |
|---|---|---|---|
| ක්‍රිස්තියානි කතෝලික | ක්‍රිස්තියානි කතෝලික සංස්කෘතිය | නත්තල් | ජේසුස් වහන්සේගේ උපත සිහිපත් කිරීම |
| | | මහ සිකුරාදා | ජේසු සමිදානන් කුරුසයේ ඇණ ගැසීම සිහි කිරීම |
| | | පාස්කු | නැවත උස්ථාපනය වීම |



| ආගම | සංස්කෘතිය | ආගමික උත්සව | පැවැත්වීමේ අරමුණ |
|---|---|---|---|
| ඉස්ලාම් | ඉස්ලාම් සංස්කෘතිය | මිලාදුන්නබි | මහම්මත් නබි තුමාගේ උපන්දිනය |
| | | රාමසාන් | |
| | | හජ්ජි | මුස්ලිම් ජනතාවගේ ශුද්ධ භූමිය ලෙස සැලකෙන මක්කම වන්දනා සමය සැමරීම |



# ශ්‍රී ලංකාවේ පවතින විවිධ සංස්කෘතීන් හා බැඳුනු සංස්කෘතික ස්ථාන

- දළදා මාලිගය
- ජය ශ්‍රී මහා බෝධිය
- කතරගම දේවාලය
- ත්‍රිකුණාමලයේ කෝණේෂ්වරම් කෝවිල
- නල්ලූර් කෝවිල
- මඩු පල්ලිය
- දවට ගහ පල්ලිය

# ශ්‍රී ලංකාවේ පවතින විවිධ සංස්කෘතීන් හා බැඳුනු  සංස්කෘතික ස්ථාන



සියළු සංස්කෘතීන්ට අයත් ලක්වැසියන් තම ජීවිතයට සම්බන්ධ සියළු කටයුතු තම ආගම හා බැඳුණු සිරිත් විරිත් වලට මුල් තැන දෙමින් සිදු කරයි.







- ❑ සිරිත් යනු , අප විසින් සිදු කරනු ලබන චාරිත්‍ර වේ .

- ❑ විරිත් යනු , අප විසින් නොකළ යුතු නැතිනම් අත්හළ යුතු දේවල් වේ .

- බහු සංස්කෘතික ලක්ෂණ කැපී පෙනෙන ඉන්දියාව ලොව ප්‍රබලතම රටකි .

- ඉන්දියාව ලොව ප්‍රබලතම බහු සංස්කෘතික රටක් වීමට බලපා ඇති හේතූන් ,

  - විවිධ ජන වර්ග ජීවත් වීම .
  - විවිධ භාෂා භාවිතය .
  - විවිධ ආගම් ඇදහීම .

| ජන වර්ගය | භාෂා | ආගම් |
| --- | --- | --- |
| දෙමළ, උර්දු, බෙංගාලි , මුස්ලිම්, බන්ජාරා, චක්මා, මුන්ඩා , මරාති | හින්දි ,උර්දු, දෙමළ, ඉංග්‍රීසි , මරාටි, මලයාලම්, පංජාබි තෙලිගු , ගුජරාටි | හින්දු , කතෝලික , ඉස්ලාම් , බෞද්ධ, ශිව |

- ලෝක බලවතා වූ ඇමරිකාව ප්‍රබල බහු සංස්කෘතික ලක්ෂණ සහිත රටකි

- ඇමරිකා එක්සත් ජනපදයේ බහු සංස්කෘතික ස්භාවය තහවුරු කරන අවස්ථා

  - විවිධ ජන වර්ග ජීවත් වීම
  - විවිධ භාෂා භාවිතය
  - විවිධ ආගම් ඇදහීම

| ජන වර්ග | භාෂා | ආගම් |
| --- | --- | --- |
| සුදු ජාතීන්, කළු ජාතීන්, ,ආසියානු ජාතීන් ඇලස්කානුවූ, රතු ඉන්දියානුවන්, හවායයින් , පැසිපික් කලාපීය ජන කොටස් | ඉංග්‍රීසි , ස්පාඤ්ඤය , සැමෝන්, කැමරූ, කැරෝකි , චීන, වියට්නාම, කොරියන් , ජර්මන් , ප්‍රංශ , රුසියන් ,ඉතාලි | ප්‍රොතෙස්තන්ත්‍ර , රෙපරමාදු , රෝමානු , කතෝලික, මුස්ලිම්, බෞද්ධ, ජුදා |

## බහු සංස්කෘතික රටක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය කටයුතු කිරීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග.

- ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනීම.
- කිසිම ආගමක් රාජ්‍ය ආගම ලෙස පිළි නොගැනීම.
- සෑම පුරවැසියෙකුටම සම අයිතිවාසිකම් හිමිවීම.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිගැනීම හා ඊට අනුකූලව ක්‍රියා කිරීම නිසා ඇමරිකා එක්සත් ජනපදය ලොව ප්‍රබල රාජ්‍යයක් බවට පත් වී ඇත.





**සවියෙන් පෙරට අපි එකට**
**e - ඉගෙනුම් පාසල**
**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 08 | පුරවැසි අධ්‍යාපනය | 02 | 03 බහු සංස්කෘතික ජන සමාජය - ඇගයීම |

සැකසුම : කේ.ඒ.එන්. ප්‍රියදර්ශනී
බප/හො/මේධංකර ම.වි

01. සංස්කෘතිය යනු කුමක්ද ?
02. සංස්කෘතිය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන දෙකක් ලියන්න.
03. බහු සංස්කෘතිය යනු කුමක්ද ?
04. ලෝකයේ බහු සංස්කෘතියක් පවතින රටවල් දෙකක් ලියන්න.
05. බහු සංස්කෘතික සමාජයක ගුණාංග තුනක් ලියන්න.
06. බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ තුනක් ලියන්න.
07. (2012) ජනලේඛණ හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව අනුව සිංහල ජනයාගේ ප්‍රතිශතය කොපමණද ?
08. ශ්‍රීලංකාවේ ජීවත් වන ජන කණ්ඩායම් දෙකක් ලියන්න.
09. ශ්‍රී ලංකාවේ ජීවත් වන ආගමික කණ්ඩායම් දෙකක් ලියන්න.
10. ශ්‍රී ලංකාවේ ජීවත් වන දෙමළ ජනයා අදහන ආගම් දෙක මොනවාද ?
11. ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතීන් හා බැඳුනු සංස්කෘතික ස්ථාන තුනත් ලියන්න.
12. සිරිත් සහ විරිත් යනු මොනවාද ?
13. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංස්කෘතීන් හැඩ ගැසී ඇත්තේ ආගම මුල් කරගෙනයි. ඒමා මොනවාද ?
14. බෞද්ධයන්ට ඉතා වැදගත් වන ආගමික උත්සව තුනක් ලියන්න.
15. හින්දු ආගම හා බැඳුනු ප්‍රධාන සංස්කෘතික උත්සව තුනක් ලියන්න.
16. ක්‍රිස්තියානි / කතෝලික භක්තිකයන් විසින් පවත්වන ප්‍රධාන ආගමික උත්සව දෙකක් ලියන්න.

17. ඉස්ලාම් බැතිමතුන් විසින් පවත්වන ප්‍රධාන සංස්කෘතික උත්සව තුනක් ලියන්න.
18. ඉන්දියාවේ පවතින ජනවර්ග / භාෂා / ආගම් තුන බැගින් ලියන්න.
19. බහු සංස්කෘතික රටක් වශයෙන් ඉන්දියාව කටයුතු කිරීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියා මාර්ග දෙකක් ලියන්න.
20. ඇමරිකා එක්සත් ජනපදයේ ජනවර්ග / භාෂා / ආගම් තුන බැගින් ලියන්න.
21. බහු සංස්කෘතික රටක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය කටයුතු කිරීම සඳහා අනුගමනය කර ඇති ක්‍රියා මාර්ග තුනක් ලියන්න.

සවියෙන් පෙරට අපි එකට
e - ඉගෙනුම් පාසල
හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 08 | පුරවැසි අධ්‍යාපනය | 02 | 03 බහු සංස්කෘතික ජන සමාජය - පිළිතුරු |

සැකසුම : කේ.ඒ.එන්. ප්‍රියදර්ශනී
බප/හො/මේධංකර ම.වි

1. මිනිසා විසින් අයත් කර ගෙන ඇත්තා වූ දැනුම විශ්වාස කලා සිරිත් විරිත් ජීවනෝපාය ආදී සියල්ලයි.
2.

- සමාජයේ සාමාජිකයෙකු වශයෙන් මිනිසා විසින් අයත් කර ගන්නාවූත් ලබා ගන්නාවූත් දැනුම විශ්වාසය කලා සදාචාර දහම් හා වෙනත් හැකියාවන්ගේ සමස්තය සංස්කෘතියයි .
- සංස්කෘතිය යනු, කිසියම් ස්ථානයක වෙසෙන ජනකායකගේ සාමූහික ජීවන ක්‍රමයයි ඔවුන්ගේ සිරිත් විරිත් ගති පැවතුම් ආචාර විචාර සමාජ සංස්ථා කලාව හා ආගම තුළින් සංස්කෘතිය ප්‍රකට වෙයි. (මහාචාර්ය විමල් දිසානායක)

3. එකම රටක් තුළ විවිධ ජන වර්ග ජීවත්වන විවිධ ආගම් අදහන, විවිධ සිරිත් විරිත් අනුගමනය කරන, විවිධ භාෂා කතා කරනු ලබන මිනිසුන්ගෙන් සමන්විත සමාජයක් වේ .
4. ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය (මින් දෙකක්)
5.
   - සෑම ජන වර්ගයටම අයත් පුද්ගලයන්ට ගරු කිරීම.
   - සෑම ජන වර්ගයටම අයත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
   - කිසිම ජන වර්ගයක් ආගමික කණ්ඩායමක් උසස් හෝ පහත් කොට නොසැලකීම.
6.
   - විවිධ ජන වර්ග ජීවත් වීම.
   - විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වීම .
   - විවිධ සිරිත් විරිත් දක්නට ලැබීම .
7. 74.9%

8. සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් (මින් දෙකක්)

9. බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්තියානි (මින් දෙකක්)

10. හින්දු, ක්‍රිස්තියානි

11. දළදා මාළිගාව, ශ්‍රී මහා බෝධිය, කතරගම දේවාලය, කෝනේෂ්වරම් කෝවිල, මඩුපල්ලිය

12.

- සිරිත් යනු අප විසින් කරනු ලබන චාරිත්‍ර වේ .
- විරිත් යනු අප විසින් නොකළ යුතු දේවල් වේ .

13. බෞද්ධ සංස්කෘතිය, ක්‍රිස්තියානි කතෝලික සංස්කෘතිය, හින්දු සංස්කෘතිය, ඉස්ලාම් සංස්කෘතිය

14. වෙසක් උත්සවය, පොසොන් උත්සවය, ඇසළ උත්සවය

15. තෛපොංගල් උත්සවය, දීපවාලී උත්සවය, මහා ශිව රාත්‍රී උත්සවය

16. නත්තල් උත්සවය, පාස්කු උත්සවය, මහ සිකුරාදා

17.

| ජන වර්ගය | භාෂා | ආගම් |
|---|---|---|
| දෙමළ | හින්දි | හින්දු |
| උර්දු | දෙමළ | කතෝලික |
| බෙංගාලි | ඉංග්‍රීසි | බෞද්ධ |

18.

- රාජ්‍ය භාෂාව ලෙස හින්දි හා ඉංග්‍රීසි භාෂා භාවිතා කිරීම .
- සෑම වාර්ගික ආගමික හා භාෂා කතා කරන කණ්ඩායමක්ම සමානාත්මතාවයෙන් යුතුව සැලකීම.

**19.**

| ජන වර්ගය | භාෂා | ආගම් |
|---|---|---|
| සුදු ජාතීන් | ඉංග්‍රීසි | රෝමානු කතෝලික |
| කළු ජාතීන් | ෂැමෝන් | මුස්ලිම් |
| රතු ඉන්දියානුවන් | චීන | බෞද්ධ |

**20.**

- ඉංග්‍රීසි භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගැනිම.
- කිසිදු ආගමක් රාජ්‍ය ආගම ලෙස පිළිනොගැනීම.
- සෑම පුරවැසියෙකුටම සමාන අයිතිවාසිකම් හිමිවීම.